**ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත**
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
**CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE**

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | CSS/03/01 | ඔබේ අංකය<br>உனது இல<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2021.05. 17 |

ලේකම්,
ප්‍රධාන/ක්‍රීඩා/අධ්‍යාපන/කෘෂිකර්ම/ධීවර අමාත්‍යාංශය
දකුණු පළාත.

**හදිසි තත්ත්වයන් තුළ පොදු මහජන හා සේවක ගැටලු විසඳීම.**

දකුණු පළාත් සභා ආයතන වෙතින් සිදු කරනු ලබන ඒ ඒ විෂයන්ට අදාල කරුණු සම්බන්ධයෙන් නිරන්තරයෙන් ගරු ආණ්ඩුකාරතුමන් වෙත යොමු වන පොදු මහජන හා සේවක ගැටලු විසඳීමේදී, එම ගැටලු සෘජුවම ගරු ආණ්ඩුකාරතුමන් වෙත යොමු වීම නිරීක්ෂණය වන බැවින් මින් ඉදිරියට පහත පරිදි ගැටලු විසඳීමේ යාන්ත්‍රණයක් සකසා ගත යුතු බව අවධාරණය කරමි.

1. **අමාත්‍යාංශ කමිටුව**
   අමාත්‍යාංශ සහ අනුබද්ධිත දෙපාර්තමේන්තුවල උක්ත දක්වන ලද පරිදි ඒ ඒ විෂයයන්ට අදාල ගැටලු විසඳීම සඳහා කමිටුවක් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පත්කල යුතුය. එහිදී විසඳා ගත නොහැකි ගැටලු පමණක් ප්‍රධාන ලේකම් කමිටුව වෙත යොමු කල යුතුය.

2. **ප්‍රධාන ලේකම් මට්ටම**
   අමාත්‍යාංශ සහ අනෙකුත් ආයතනවලින් යොමු වන ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ලබාදීම ප්‍රධාන ලේකම් මට්ටමේ කමිටුව මඟින් සිදුවන අතර, අවශ්‍ය අවස්ථාවලදී අදාල දිස්ත්‍රික් ලේකම්වරු ඇතුළු මධ්‍යම රජයේ ආයතන ප්‍රධානීන් සම්බන්ධ කර ගනිමින් අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

3. **ගරු ආණ්ඩුකාරතුමන් වෙත යොමු කිරීම.**
   ප්‍රධාන ලේකම් මට්ටමින් විසඳිය නොහැකි ගැටලු සහ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් අවසාන තීරණ ලබා ගැනීම සඳහා වන කරුණු ප්‍රධාන ලේකම් මඟින් ගරු ආණ්ඩුකාරතුමන් වෙත යොමු කරනු ඇත.

02. මේ අනුව මින් ඉදිරියට උක්ත දක්වන ලද පරිදි කටයුතු කිරීමට සියලු යටත් ආයතන සහ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසන ලෙසත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ උපදෙස් පරිදි කාරුණිකව දන්වමි. මෙම කමිටු අවශ්‍යතාවය අනුව කැඳවා කටයුතු කිරීම ගැන දැඩි අවධානය යොමු කරවනු ලැබේ.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් -

| | | |
|---|---|---|
| 1. | ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | (කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.) |
| 2. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | (කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.) |
| 3. | සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය | (කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.) |
| 4. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/පිරිස්/මුදල්/සැලසුම්/ඉංජිනේරු සේවා) | (කරු.දැ.ගැ.ස. හා අ.ක.ස.) |

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 4119010, 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් (1) ට එන යහපාලනයක්"